# ප්‍රතිසංස්කරණ සඳහා සාමූහිකය
# திருத்தத்திற்கான கூட்டு
# COLLECTIVE FOR REFORMS

## ප්‍රතිසංස්කරණ සඳහා වූ සාමූහිකය විසින් ජනතා කැමැත්තට ගරු කරන ලෙස ජනපතිට කෙරෙන ඉල්ලීමක්

26.07.2022

පාර්ලිමේන්තුව විසින් විධායක ජනාධිපති ධූරයට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා තෝරා පත් කර ගැනීම පිළිගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලියක් හරහා සිදුවූ බව පහත අත්සන් කර ඇති සිවිල් සමාජ සාමාජිකයන් වන අපි සටහන් කරමු. එතුමාට සුබ පතන අතරම මේ වන විට සමස්ත ජාතියම ගිලගෙන ඇති මිනිසා විසින් නිර්මාණය කරණ ලද , මෙම වළක්වා ගත හැකි ව්‍යසනය හේතුවෙන් අවදානමට ලක්ව අපමණ දුක් විඳින පුරවැසියන් රැසකගේ ජීවිත බේරා ගෙන අපේ රට ආර්ථික හා දේශපාලනික අගාධයකට වැටීම වැළැක්වීමට සඳහා එතුමා ඇතුළු රජය නුදුරු අනාගතයේදී ගන්නා සියලු ක්‍රියාමාර්ග ඉතා වැදගත් වන බව සඳහන් කරමු.

**සාමකාමී විරෝධතාකරුවන් ප්‍රචණ්ඩකාරී ලෙස නෙරපා හැරීම**

ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් අනුව නීතියේ ආධිපත්‍යය, ආර්ථික හා දේශපාලන නිදහස තහවුරු කිරීම සඳහා වූ ජනතා අරගලයේ උච්චතම අවස්ථාවට එක් වූ සාමූහිකයක් ලෙස අපි, ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට දින 104 ක් පුරා එම නිදහස සහ සාරධර්ම වෙනුවෙන් හඬනගමින් සිටි සාමකාමී විරෝධතාකරුවන් පොලිසිය සහ හමුදාව විසින් පසුගිය දා රාත්‍රියේ බලහත්කාරයෙන්, අමානුෂික සහ ප්‍රචණ්ඩ ලෙස පලවා හැරීම පිළිබඳව අපගේ අවිවාදිත, පැහැදිලි විරෝධය සටහන් කරමු.

සෑම ක්ෂේත්‍රයකම ජාත්‍යන්තර සහය සහ පිළිගැනීම අත්‍යවශ්‍යය මොහොතක,ඒ වෙනුවට ජාත්‍යන්තර් අප්‍රසාදයට හේතු වූ විදෙස් මාධ්‍යවේදීන් ඇතුළු මාධ්‍යවේදීන්ට පහර දීම, ගිලන්රථ සහ වෛද්‍ය නිලධාරීන් ප්‍රහාරය සිදුවූ ස්ථානයට ක්ෂණික ප්‍රවේශ වීම වැළැක්වීම සම්බන්ධයෙන් වගවීම පිළිබඳ විමර්ශනයක් ඉල්ලා සිටිමු. මානව හිමිකම් සම්මතයන් සහ වගවීමේ මූලධර්ම අනුගමනය කරමින් ජාත්‍යන්තර මුල්‍ය අරමුදල (IMF) සහ යුරෝපා සංගමය (EU) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඔවුන්ගේ මැදිහත්වීම් කොන්දේසිගත කර ඇති බව අපි තවදුරටත් සටහන් කරමු.

**අන්තර්කාලීන රජය සහ අමාත්‍ය මණ්ඩලය**

බහුපාර්ශ්වික අන්තර්වාර ආණ්ඩුවක් සඳහා ලබාදී ඇති සියලු සහතිකවලට පටහැනිව ජනතාව විසින් ප්‍රතික්ෂේප කළ හිටපු ජනාධිපතිවරයාගේ ආණ්ඩුව නියෝජනය කළ මැති ඇමතිවරු බහුතරයකින් අභිනව අමාත්‍ය මණ්ඩලය පත්කිරීම සම්බන්ධයෙන්ද සාමූහිකය කම්පාවට පත්ව ඇත. තවද, මෙම පත්වීම් මගින් පෙන්නුම් කරන්නේ එම ධූර සඳහා පත්කිරීමේදී සලකා බැලිය යුතු යැයි අරගලකරුවන් ,ජනතාව සහ අපගේ සාමූහිකය මෙන්ම සර්ව ආගමික නායකයින්, වෘත්තීය සමිති, වාණිජ මණ්ඩල, වෘත්තීය සංගම් වැනි බොහෝ පුරවැසි කණ්ඩායම් ඉල්ලා සිටි ඉල්ලා සිටි නොකිළිටි වාර්තාවක්, මහජන විශ්වාසයක් සහ අවශ්‍ය මූලික විශේෂඥතාවක් යන පත් වුවන්

සහතික කිරීමේ ජනතාවගේ ඉල්ලීම් නොසලකා හැරීම සහ නොසලකා හැරීමයි. මේ සම්බන්ධයෙන් අපි ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ වහාම පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කර පිරිසිදු වාර්තාවක් සහිත සුදුසුකම් ලත් විශ්වාසවන්ත ඇමැතිවරුන්ගෙන් යුත් කුඩා අමාත්‍ය මණ්ඩලයක් පත් කරන ලෙසයි.

මෑත කාලීනව සිදු වූ සිදුවීම් සාධාරණීකරණය කිරීම සඳහා ව්‍යවස්ථාමය හිඩැස් භාවිතා කරන ආකාරය අපි කනස්සල්ලෙන් සටහන් කරන අතර නීතියේ අක්ෂරය මත පදනම්ව නීතියේ ආත්මය උල්ලංඝනය නොකළ යුතු බව අපි කියා සිටිමු. එකඟ වූ අවම පොදු ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාවට නංවා රට යථා තත්ත්වයට පත් කර ජනතා අපේක්ෂා ඉටු කරණ සහ ජනතා පරමාධිපත්‍යය යළි ස්ථාපිත කරණ බහුපාර්ශ්වික අන්තර්වාර රජයක් වහා පිහිටුවමින් එය නිවැරදි කරණ ලෙස අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිමු.

ඒ අනුව අපි ජනාධිපතිවරයාගෙන් සහ රජයෙන් ඉල්ලා සිටින්නේ:

1. හිටපු සහ වත්මන් ජනාධිපතිවරුන් විසින් එකඟ වූ සහ ජනතාව, සිවිල් සමාජය සහ ආගමික නායකයින් විසින් ඉල්ලා සිටින පරිදි විපක්ෂයේ සහාය ඇතිව සර්ව පාක්ෂික අන්තර්වාර රජයක් වහාම පිහිටුවීම.

2. ජාතික අවශ්‍යතා සඳහා තීරණ ගැනීමේදී සංවරණ සහ තුලන කාර්යභාරයක් ඉටු කිරීමට පාර්ලිමේන්තුවට සහ ස්වාධීන කොමිෂන් සභාවලට සහ රාජ්‍ය ආයතනවලට බලය පැවරීම සහතික කිරීම සඳහා 21 වැනි සංශෝධනය බලාත්මක කිරීම.

3. ආර්ථිකය නගා සිටුවීමට සහ ජීවිතයේ මූලික අවශ්‍යතා සඳහා ප්‍රවේශය සහතික කිරීම, ආර්ථික පසුබෑම හේතුවෙන් පීඩාවට පත් වූ කොටස් සහ කණ්ඩායම්වලට සහාය වීම සහ මහජන විශ්වාසය දිනා ගැනීමට විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා අවම පොදු ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ආරම්භ කිරීම.

4. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳ ජනමත විචාරණයක් සහ පාර්ලිමේන්තුවේ නීත්‍යානුකූලභාවය නැති වී ඇති බව පිළිගනිමින් (බොහෝ කල් ගතවී ඇති) පළාත් සහ පාර්ලිමේන්තුව සඳහා නිශ්චිත කෙටි කාල රාමුවක් තුළ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම.

5. ජනාධිපතිවරයා සහ රජය විසින් වහාම නීතිමය ප්‍රතිපාදන සැපයිය යුතු නව ආයතනික වැඩපිළිවෙලක් ලෙස අන්තර්වාර රජයේ අමාත්‍ය මණ්ඩලයට උපදෙස් දීම සඳහා වෘත්තිකයන්ගෙන් සමන්විත කමිටුවක් ( දේශපාලනඥයින් නොවන ) පත් කිරීම.

මේ අතර, සිවිල් සමාජයක් ලෙස අපි බොහෝ සංවිධාන සහ පුද්ගලයන් සාමූහිකව නියෝජනය කරමින් සහ අප වෙනුවෙන් ජනතාව ඉල්ලා සිටින ඉහත සඳහන් කළ අත්‍යවශ්‍ය වැඩ පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන සැබෑ ප්‍රයත්නයන් සඳහා ඕනෑම විභව දායකත්වයක් ලබා දීමට ප්‍රතිඥා දෙමු.

ප්‍රජාතන්ත්‍රවාදීව සහ සම්මුතිවාදීව රටත් ජනතාවත් මුහුණ දෙන දුෂ්කර ආර්ථික අභියෝග ජය ගැනීම සඳහා වන සැලසුම් සකස් කිරීම සඳහා විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ප්‍රමුඛ සියලු ජන කොටස්වල අවශ්‍යතාවලට ආමන්ත්‍රණය කරණ ප්‍රජාතන්ත්‍රවාදී,සාමය, සංහිඳියාව, යුක්තිය සහ ජාතික සමගිය ආරක්ෂා කරණ පාරදෘශ්‍ය සහ වගකිවයුතු පාලනයක් යටතේ ආර්ථික සැලැස්මක් සහ උපාය මාර්ගයක් වඩාත් තිරසාර වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

පූජ්‍ය මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි - මහජන සභාව

ගරු ආසිරි පෙරේරා රදගුරුතුමා

ගරු අනුර එල් පෙරේරා පියතුමා - මහජන සභාව

ගරු නොයෙල් ඩයස් පියතුමා

මහාචාර්ය ශ්‍යාම බන්නැහැක - විශ්වවිද්‍යාල ආචාර්ය සංගමය

ආචාර්ය විනයා ආරියරත්න - සභාපති, සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය

රෝහණ හෙට්ටිආරච්චි - පැෆරල්

උපේක්ෂි ප්‍රනාන්දු - මාර්තු 12 ව්‍යාපාරය

ආචාර්ය ජෙහාන් පෙරේරා - විධායක අධ්‍යක්ෂ ජාතික සාම මණ්ඩලය

සමාදානි කිරිවන්දෙණිය - සණස ව්‍යාපාරය

ප්‍රසන්න ඇලපාත - සභාපති, ශ්‍රී ලංකා විගණක සේවා සංගමය

උදේනි දිසානායක - ලේකම්, ජාතික වෘත්තීය සමිති පෙරමුණ

තමරා දයානි හෙට්ටිමුල්ලගේ - ජාතික වෘත්තීය සමිති පෙරමුණ

රවි කුමුදේශ් - සෞඛ්‍ය වෘත්තීයවේදීන්ගේ විද්වත් සංගමය

ජෙෆ්රි අලගරත්නම් - ජනාධිපති නීතිඥ- ඩිරෙක්ෂන් ශ්‍රී ලංකා

මහාචාර්ය ප්‍රසාද් කටුලන්ද - ඩිරෙක්ෂන් ශ්‍රී ලංකා

තිලක් කාරියවසම් - සිවිල් සමාජ සාමූහිකය

නදීෂානි පෙරේරා - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා

සමන් හමන්ගොඩ - පැල්ට්‍රා

සුනිල් ජයසේකර - සමාජ සාධාරණත්වය සඳහා වූ ජාතික ව්‍යාපාරය

නිශාන්ත ප්‍රීතිරාජ් - දේශෝදය ජාතික සභාව

චමීර දෙද්දුවගේ - සමාජ ක්‍රියාකාරී

දයා හේරත් - ලක්බිමේ මව්වරු සහ දියණියෝ

විශාකා ධර්මදාස - යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන්ගේ සංගමය

ඔස්ටින් ප්‍රනාන්දු - හිටපු ජනාධිපති ලේකම්

ඉංජිනේරු මංගල පී. බී යාපා - වරලත් ඉංජිනේරු

ආචාර්ය සෝමරත්න දිසානායක - චිත්‍රපට අධ්‍යක්ෂක

ක්‍රිස්ටෝබෙල් සවරිමුත්තු - පැෆ්රල් සම සභාපති

කේ.එන් ඩීන් - තරුණ මුස්ලිම් සංගමය (YMMA)

පාලිත ලිහිණිකුමාර - සමාජ සාධාරණත්වය සඳහා වූ ජාතික ව්‍යාපාරය

නීතිඥ ජාවිඩ් යූසුෆ්

මහාචාර්ය ටී ජයසිංහම්

ආචාර්ය දයානි පනාගොඩ

හිල්මි අහමඩ් මහතා